# කාර්ය සාධන වාර්තාව

# செயலாற்றுகை அறிக்கை

# Performance Report

## 2013

## කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව

## முகாமைத்துவக் கணக்காய்வுத் திணைக்களம்

## DEPARTMENT OF MANAGEMENT AUDIT


මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය
කොළඹ 01.

நிதி, திட்டமிடல் அமைச்சு,
செயலகம்
கொழும்பு 01.

Ministry of Finance and Planning
The Secretariat
Colombo 01.

රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 හි උපදෙස්වලට අනුව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2013 වර්ෂයේ මූල්‍ය හා භෞතික කාර්යසාධනය මෙමගින් ඉදිරිපත් කෙරේ.

# කාර්ය සාධන වාර්තාව - 2013

# කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව

**පටුන** **පිටු අංකය**


| | | |
|---|---|---|
| 01. | දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර, අරමුණු, කාර්යයන් හා වගකීම් | 02 |
| | 1.1 දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය | 04 |
| 02. | මූල්‍ය පරිපාලනය | 05 |
| 03. | භෞතික කාර්ය සාධනය | |
| 3.1 | රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණනයෙහි වගකීම් සහ ශක්තිමත් කිරීම්මය ඉහළ නැංවීම | 06 |
| 3.1.1 | අභ්‍යන්තර විගණන නිලධාරීන්ගේ හැකියා වර්ධනය කරලීම | 06 |
| 3.2 | අභ්‍යන්තර විගණනය සඳහා මාර්ගෝපදේශ සැපයීම | 07 |
| 3.3 | විගණන හා කළමනාකරණ කමිටු සඳහා භාණ්ඩාගාර නියෝජනය මගින් රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීම | 07 |
| 3.4 | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය සහ භාණ්ඩාගාර දෙපාර්තමේන්තු කළමනාකරණ විගණනය | 08 |
| 3.5 | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ විවිධ දෙපාර්තමේන්තු යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති අභ්‍යන්තර විගණනය | 09 |
| 3.6 | විශේෂ විමර්ශන හා විගණන කටයුතු | 09 |
| 04. | මානව සම්පත් සංවර්ධනය හා පොදු පරිපාලනය | 12 |
| 4.1 | කාර්ය මණ්ඩලය | 12 |
| 4.2 | කාර්ය මණ්ඩල පුහුණුවීම් | 14 |
| 4.2.1 | 2013 වර්ෂයේ දේශීය පුහුණුවීම් | 14 |
| 4.2.2 | විදේශීය පුහුණු | 16 |
| 4.2.3 | කාර්යාභිවර්ධන වැඩසටහන් | 17 |

## 01. දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර, අරමුණු හා කාර්යයන්

### දැක්ම

ඉහලම කාර්ය සාධනයකින් හා වගවීමකින් යුත් රාජ්‍ය සේවයක් උදෙසා වටිනාකම් එකතුකරන විශිෂ්ඨතම කළමනාකරණ විගණන කොටස්කරු බවට පත්වීම.

### මෙහෙවර

කළමනාකරණ විගණනය තුලින් රාජ්‍ය සේවයේ වගවීම ඉහළ නැංවීම හා වටිනාකම් එකතු කිරීම සඳහා ස්වාධීන හා අරමුණු කරා ලඟාවීම සහතික කෙරෙන උපදේශාත්මක සේවා සැපයීම.

### අරමුණු

1. රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණනයෙහි ඵලදායීත්වය ඉහල නැංවීම සඳහා දායක වීම.
2. විගණන හා කළමනාකරණ කමිටු මගින් අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීම.
3. කළමනාකරණ විගණනය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ හඳුන්වා දීම.
4. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය සහ භාණ්ඩාගාර දෙපාර්තමේන්තු කළමනාකරණ විගණනය මගින් ඉහල කළමනාකාරිත්වයට සහායවීම.
5. සංවර්ධන ව්‍යාපෘතීන්හී කළමනාකරණ විගණන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම
6. විශේෂ විමර්ශන කටයුතු තුලින් රාජ්‍ය අංශයේ සිදුවන හා සිදුවිය හැකි අක්‍රමිකතා අනාවරණය කිරීම හා එවැනි තත්ත්වයන් හා සිදුවීම් වලක්වා ගැනීමට නිර්දේශයන් සහ නිවාරණ ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම.

## කාර්යයන් හා වගකීම්

1. රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණනයේ ගුණාත්මකභාවය හා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා මූලික ආයතනය ලෙස කටයුතු කිරීම.

2. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය, භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සහ ඒ යටතේ ඇති ව්‍යාපෘති කළමනාකරණ විගණනය.

3. අභ්‍යන්තර විගණනය සඳහා මාර්ගෝපදේශ හඳුන්වාදීම.

4. අභ්‍යන්තර විගණන ඒකක සම්බන්ධීකරණය හා අවශ්‍ය මග පෙන්වීම් කිරීම.


5. රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණකවරුන්ගේ අභ්‍යන්තර විගණන කුසලතා දියුණු කිරීම.

6. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ කළමනාකරණ විගණන කමිටු රැස්වීම් පැවැත්වීම සහ අනෙක් අමාත්‍යාංශවල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියෝජනය කිරීම හා මහපෙන්වීම.

7. රාජ්‍ය අංශය අනුගමනය කරන අවධානම් ඇගයීමේ ක්‍රමවේදයේ ප්‍රමාණාත්මක බව ඇගයීම.

8. විශේෂ විමර්ශන කටයුතු සිදු කිරීම.

## 1.1 දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය




කාර්යාල සේවක සේවය - 4 , රියදුරු - 7

## 02. මූල්‍ය පරිපාලනය

2013 අයවැය ඇස්තමේන්තුව මගින් වැය ශීර්ෂ 324 වැඩසටහන අංක 01 ව්‍යාපෘතිය 01 යටතේ මෙම දෙපාර්තමේන්තුව සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබිණි. එම ප්‍රතිපාදන වැය කළ ආකාරය පහත දැක්වේ.

| වියදම් විස්තරය | අයවැය ඇස්තමේන්තු වෙන්කිරීම (රු.) | පරිපූරක ප්‍රතිපාදන (රු.) | මු.රෙ.66 හා 69 අනුව මාරු කිරීම් (රු.) | තත්‍ය වියදම (රු.) | ඉතිරිය (රු.) |
|---|---|---|---|---|---|
| **පුනරාවර්තන වියදම් (අ)** | **25,710,000** | - | | **22,075,529** | **3,634,471** |
| පුද්ගල පඩිනඩි | 17,300,000 | - | - | 14,717,682 | 2,582,318 |
| අනෙකුත් වියදම් | 8,410,000 | - | 654,030<br>(654,030) | 7,357,847 | 1,052,153 |
| **මූලධන වියදම් (ආ)** | **1,600,000** | - | - | **1,326,091** | **273,909** |
| 2001 ගොඩනැගිලි හා ඉදිකිරීම් | - | - | - | - | - |
| 2002 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 200,000 | - | - | 189,280 | 10,720 |
| 2003 වාහන | 100,000 | - | - | - | 100,000 |
| 2102 කාර්යාලීය උපකරණ | 200,000 | - | - | 158,298 | 41,702 |
| 2103 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 600,000 | - | - | 576,400 | 23,600 |
| 2401 හැකියා වර්ධනය | 500,000 | - | - | 402,113 | 97,887 |
| **මුළු එකතුව (අ) + (ආ)** | **27,310,000** | - | - | **23,401,620** | **3,908,380** |

### රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම

2013 වර්ෂය සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රජයේ නිලධාරීන්ගේ අනුමත අත්තිකාරම් බී ගිණුමේ විස්තර පහත දැක්වේ.

| විස්තරය | අනුමත සීමාව (රු.) | තත්‍ය වියදම (රු.) |
|---|---|---|
| උපරිම වියදම් සීමාව | 2,000,000 | 1,486,993 |
| අවම ලැබීම් සීමාව | 1,200,000 | 1,350,713 |
| උපරිම හර ශේෂ සීමාව | 11,000,000 | 7,371,542 |

# 03. භෞතික කාර්ය සාධනය

## 3.1 රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණනයෙහි ඵලදායීත්වය ඉහළ නැංවීම

### 3.1.2 අභ්‍යන්තර විගණන නිලධාරීන්ගේ හැකියා වර්ධනය කරලීම

අමාත්‍යාංශ, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා දෙපාර්තමේන්තුවල සේවයේ නියුක්තව සිටින ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් / අභ්‍යන්තර විගණකවරුන්ගේ වෘත්තීය දැනුම ඉහළ නැංවීමට හා විගණනය පිළිබඳව කාලීන තොරතුරු ලබාදීමට කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව නිරතුරුවම කටයුතු කරයි. එම අරමුණ ඇතිව 2013 වර්ෂය තුලදී දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් වැඩමුළු පවත්වන ලදී.

- අමාත්‍යාංශ / දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා දෙපාර්තමේන්තු ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් සඳහා **"කාර්ය සාධන විගණනය හා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් කළමනාකරණය"** පිළිබඳ පුහුණු වැඩමුළුවක් 2013.03.18 දින මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ **"රන්දොර"** ශ්‍රවණාගාරයේදී පැවැත්විය.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සේවය කරනු ලබන ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන්ගේ කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා පුහුණු වැඩමුළුවක් 2013 සැප්තැම්බර් මස 27 වන දින මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ **"රන්දොර"** ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

- රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සේවය කරනු ලබන ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් සඳහා සංවිධානය කරන ලද **"වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම"** පිළිබඳ පුහුණු වැඩසටහන් සඳහා සම්පත්දායකයන් ලෙස මෙම දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් සහභාගි විය.

## 3.2 අභ්‍යන්තර විගණනය සඳහා මාර්ගෝපදේශ සැපයීම

පහත සඳහන් ක්ෂේත්‍රයන්හි විගණන කටයුතු වඩාත් කාර්යක්ෂම හා ඵලදායීව ඉටුකිරීම අරමුණුකොටගෙන අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ නිකුත් කිරීමේ අවශ්‍යතාවය දෙපාර්තමේන්තුව විසින් හඳුනාගනු ලැබීය.

1. අමාත්‍යාංශවල හා දෙපාර්තමේන්තුවල ක්‍රියාත්මක වන විවිධ වැඩසටහන්වල ආර්ථික, කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය පරීක්ෂා කිරීම සඳහා කාර්ය සාධන විගණනය (Performance Audit) පිළිබඳ මාර්ගෝපදේශය.
2. අමාත්‍යාංශවල හා දෙපාර්තමේන්තුවල විශේෂ විමර්ශන පැවැත්වීම සම්බන්ධ මාර්ගෝපදේශය.

දැනට එම විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ වඩාත් ප්‍රායෝගික දැනුම ඇති අභ්‍යන්තර විගණකවරුන් හා විෂය දැනුම ඇති වෙනත් පාර්ශවයන් සමඟ සාකච්ඡා කර අදාළ කෙටුම්පත් මාර්ගෝපදේශ සකස් කර අවසන් කර ඇත. ඊළඟ වර්ෂය තුලදී මෙම කෙටුම්පත් තවදුරටත් සංවිධානයකොට මාර්ගෝපදේශ නිකුත් කිරීමට සැලසුම් කර ඇත.

## 3.3 විගණන හා කළමනාකරණ කමිටු සඳහා භාණ්ඩාගාර නියෝජනය මගින් රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීම

රජයේ අමාත්‍යාංශයන්හි ස්ථාපිත විගණන හා කළමනාකරණ කමිටුවලට භාණ්ඩාගාර නියෝජිත ලෙස මෙම දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් සහභාගී වේ. එම නිලධාරීන් විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් ඵලදායීව හා අඛණ්ඩව පැවැත්වීම පිළිබඳව මාර්ගෝපදේශ සැපයීම හා අධීක්ෂණය කිරීම් සිදුකර ඇත. එහිදී ප්‍රධාන වශයෙන් අමාත්‍යාංශ හා ඒ යටතේ ඇති ආයතනවල අභ්‍යන්තර විගණන ඒකක ශක්තිමත් කිරීමත් , අභ්‍යන්තර විගණන වාර්තා හා රජයේ විගණන විමසුම්වලින් පෙන්වා දෙන කරුණු සාකච්ඡාවට භාජනය කර, ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් ලබාදීමත්, ඒ අනුව ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳව පසු විපරම් කිරීමත් මඟින් රාජ්‍ය අංශයේ කළමනාකරණ කටයුතු ශක්තිමත් කිරීමට දායකත්වය සපයා ඇත.

චක්‍රලේඛ විධිවිධාන අනුව 2013 වසර තුළ අමාත්‍යාංශ 55 ක පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 193 කටද, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, ජ්‍යෝෂ්ඨ අමාත්‍ය කාර්යාලය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, මැතිවරණ දෙපාර්තමේන්තුව, දුම්රිය දෙපාර්තමේන්තුව හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව යන රාජ්‍ය ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 24 ක් සඳහාද මෙම දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් සහභාගී වී ඇත.

## 3.4 මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය සහ භාණ්ඩාගාර දෙපාර්තමේන්තු කළමනාකරණ විගණනය

මුදල් අමාත්‍යාංශය හා පහත සඳහන් දෙපාර්තමේන්තුවලට අදාළ කළමනාකරණ විගණනය සිදු කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යයක් සේ සැලකේ. 2013 වර්ෂයේදී ද මෙම කාර්යය සාර්ථකව සිදු කළ අතර, ඒ අනුව සෑම ආයතනයක් වෙනුවෙන්ම කාර්තුවකට එක් කළමනාකරණ විගණන වාර්තාවක් බැගින් කළමනාකරණ විගණන වාර්තා 04ක් නිකුත් කර ඇත. එමගින් එම ආයතනවල කාර්යක්ෂම හා ඵලදායී අභ්‍යන්තර පාලන විධි ක්‍රම පවත්වාගෙන යාමටත් ඒ තුළින් වඩාත් ඉහළ කාර්ය සාධනයක් ළඟාකර ගැනීමටත් පිටුවහලක් ලැබී ඇත.

01. ජාතික අයවැය දෙපාර්තමේන්තුව
02. ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
03. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
04. රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
05. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
06. විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
07. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
08. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
09. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
10. කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
11. වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
12. නීති කටයුතු දෙපාර්තමේන්තුව
13. ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව
14. සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව
15. ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුව

## 3.5 මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ විවිධ දෙපාර්තමේන්තු යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති අභ්‍යන්තර විගණනය

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබන කාර්යභාරයට මුදල් අමාත්‍යාංශය යටතේ ඇති විවිධ දෙපාර්තමේන්තු මඟින් විදේශාධාර යටතේ ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතීන්හි අභ්‍යන්තර විගණන කටයුතු ද ඇතුලත්ය.

ඒ අනුව, සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක කරනු ලබන පහත සඳහන් ව්‍යාපෘතියෙහි අභ්‍යන්තර විගණන කටයුතු මෙම දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබයි.

**සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය (SMEDeF)**

2013 වර්ෂයේදී ද මෙම ව්‍යාපෘතියෙහි අභ්‍යන්තර විගණන කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී. ව්‍යාපෘතියෙහි විෂය පථය 2013 වර්ෂය තුල වෙනසකට භාජනය වූ බැවින් ඊට අදාළ ගිවිසුම් අත්සන් තැබූ පසු අභ්‍යන්තර විගණන වාර්තාව නිකුත් කිරීමට නියමිතය.

## 3.6 විශේෂ විමර්ශන හා විගණන කටයුතු

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා වශයෙන් අතිගරු ජනාධිපතිතුමා වෙත මෙන්ම මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්තුමා වෙත ලැබෙන පැමිණිලි මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ නියමය පරිදී පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලබයි. එසේ යොමු කරනු ලදුව ඉටුකරන ලද පරීක්ෂණයන්ගේ වාර්තාවන් භාණ්ඩාගාර ලේකම්ගේ උපදෙස් මත ඉදිරි කටයුතු සඳහා අදාළ අමාත්‍යාංශ ලේකම්වරයාට හෝ අදාළ ආයතන ප්‍රධානීන් හට යොමු කරනු ලබන අතර විමර්ශනය අනුව හෙළිදරව් වන අඩුපාඩු සහ අක්‍රමිකතා නැවත ඇතිවීම වළක්වා ගැනීම මෙහි අරමුණ වේ.

## 2013 වර්ෂයේදී කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව මඟින් සිදු කළ විමර්ශන

2013 වසර තුල මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම් විසින් මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද පහත සඳහන් පැමිණිලි පිළිබඳව විමර්ශනයන් සිදුකොට වාර්තා කරන ලදී.

| අනු අංකය | ආයතනය | විමර්ශනය |
|---|---|---|
| 01 | ජාතික ලොතරැයි මණ්ඩලය | ජාතික ලොතරැයි මණ්ඩලයේ සිදුවෙමින් පවතින අක්‍රමිකතා |
| 02 | ජාතික ලොතරැයි මණ්ඩලය | සේවිකාවන් සඳහා සාරි මිලදී ගැනීම |
| 03 | ලංකා ධීවර සංස්ථාව | සංස්ථාවේ සිදුවන අක්‍රමිකතා |
| 04 | පළාත් පාලන අමාත්‍යාංශය | ලෝක බැංකු ආධාර යටතේ පළාත් මාර්ග ව්‍යාපෘතියේ විෂමතාවයන් |
| 05 | කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය | නිල රථ අයථා භාවිතය |
| 06 | ජාතික ලොතරැයි මණ්ඩලය | ජාතික ලොතරැයි මණ්ඩලයේ ඇතැම් නිලධාරීන්ගේ ක්‍රියාකලාපය |
| 07 | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ සිදුවී ඇති දූෂණ |
| 08 | 2013 දැයට කිරුළ | 2013 දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය සම්බන්ධව |
| 09 | ශ්‍රී ලංකා සමාජ අරක්ෂණ මණ්ඩලය | මුදල් අයථා ගණුදෙනුව |
| 10 | කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය | කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සිදුවන අක්‍රමිකතා |
| 11 | රාජ්‍ය සේවා විශ්‍රාමික අරමුදල | රාජ්‍ය සේවා විශ්‍රාමික අරමුදලේ නිලධාරීන්ගේ අක්‍රමිකතා |
| 12 | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | වාහන අනතුරු රක්ෂණ වන්දි අයථා ලෙස ලබාගැනීම |
| 13 | ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය | අයථා මුදල් නාස්තිය පිළිබඳව |
| 14 | ජාතික ලොතරැයි මණ්ඩලය | ටෙන්ඩර් ප්‍රදානය සම්බන්ධව |
| 15 | ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව | ලංකා පුත්‍ර සංවර්ධන බැංකුවේ සිදු වී ඇති අක්‍රමිකතා |
| 16 | ජාතික ලොතරැයි මණ්ඩලය | ලොතරැයි දිනුම් ඇදීම සඳහා ලබාදීමට මෝටර් රථ 60 ක් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම සම්බන්ධව |
| 17 | දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව | ආරක්ෂක සේවා ටෙන්ඩරය ප්‍රදානය කිරීම |

## 2013 වර්ෂයේදී කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව මඟින් සිදු කළ විශේෂ විගණන

| අනු අංකය | මාතෘකාව | ප්‍රගතිය |
|---|---|---|
| 01 | දැයට කිරුළ විගණන කටයුතු අධීක්ෂණය | 2013 වර්ෂයේ දැයට කිරුළ වැඩසටහන පැවති කුරුණෑගල, කෑගල්ල හා පුත්තලම දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි සේවය කරන අභ්‍යන්තර විගණකවරුන් සහය කරගෙන දැයට කිරුළ වැඩසටහන යටතේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘති සම්බන්ධව සිදු කරන ලද විගණනයේ අධීක්ෂණ කටයුතු මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදු කෙරුනි. මෙය විගණන දැනුම බෙදාහදා ගැනීම, විගණන අඩුපාඩු හඳුනාගැනීම සහ නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා පිටුවහලක් විය. |
| 02 | විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය | මෑත කාලීනව විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධව ඇතිවී තිබෙන අක්‍රමිකතා සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන පද්ධතිවල දුර්වලතා හඳුනාගැනීම හා ඒවාට පිළියම් යෙදීම අරමුණු කරගෙන තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය නියැදියක් ලෙස පදනම් කරගනිමින් විශේෂ විගණනයක් සිදුකර ඇත. |
| 03 | සමෘද්ධි අධිකාරියේ වත්කම් විගණනය | දිවිනැගුම දෙපාර්තමේන්තුව ආරම්භ කිරීමට පූර්ව කටයුත්තක් ලෙස දිවයින පුරා පැතිරුනු සමෘද්ධි කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල නිලධාරීන් 200 කගේ පමණ සහභාගිත්වයෙන් සමෘද්ධි අධිකාරියෙහි වත්කම් විගණනයක් සිදුකරන ලදී. මේ සඳහා මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ ක්‍රියාකාරී සහභාගිත්වය තුලින් ඔවුන්ට අවශ්‍ය ප්‍රායෝගික පුහුණුව හා මඟපෙන්වීම ලබාදෙන ලදී. |
| 04 | e-friends ව්‍යාපෘතිය | ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (JICA) ආධාර යටතේ ක්‍රියාත්මක කරන ලද මෙම ව්‍යාපෘතියෙහි ක්‍රියාකාරිත්වය පිළිබඳ විශේෂ විගණනයක් සිදු කරන ලදී. ව්‍යාපෘතිය පිළිබඳ පැනනැඟුණු ගැටළුකාරී තත්ත්වය සමනය කිරීම සඳහා භාණ්ඩාගාර ලේකම්තුමාගේ උපදෙස් පරිදි කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය සහයෝගය ලබාදෙන ලදී. මෙහිදී ව්‍යාපෘතියට සම්බන්ධ වූ සියළුම රාජ්‍ය හා පුද්ගලික බැංකු සමඟ සම්බන්ධවී විගණනය සිදු කළ අතර එහි වාර්තාවෙහි පිටපත් විගණකාධිපති වෙත හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. |

# 4. මානව සම්පත් සංවර්ධනය හා පොදු පරිපාලනය

## 4.1 කාර්ය මණ්ඩලය

කළමනාකරණ විගණන අධ්‍යක්ෂ ජනරාල් යටතේ ක්‍රියාත්මක වන මෙම දෙපාර්තමේන්තුවේ අනුමත සමස්ථ කාර්ය මණ්ඩලය 48 ක් වන අතර, 2013 වර්ෂයට අදාළ කාර්ය මණ්ඩල විස්තරය පහත දක්වා ඇත.

| තනතුර | සේවක සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | අනුමත | සිටින | පුරප්පාඩු |
| අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 | - |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 | - |
| අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ග.සේ. / ශ්‍රී.ලං.ක්‍ර.සේ. / ශ්‍රී.ලං.ප.සේ.) | 08 | 08 | - |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ග.සේ.) සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ග.සේ.) | 07 | 01 | 06 |
| සංවර්ධන නිලධාරී | 06 | 02 | 04 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර (රා. ක. ස) | 14 | 11 | 03 |
| රියදුරු | 07 | 05 | 02 |
| කා.සේ.සේ. | 04 | 04 | - |
| **එකතුව** | **48** | **33** | **15** |

**2013 වර්ෂයේ ස්ථාන මාරු ලැබ දෙපාර්තමේන්තුවට පැමිණි නිලධාරීන්**

| | **නම** | **තනතුර** |
|---|---|---|
| 01. | ඒ.එන්. හපුගල මයා | අධ්‍යක්ෂ |
| 02. | චම්පිකා රණසිංහ මෙය | අධ්‍යක්ෂ |
| 03. | කේ.ඒ.එච්.එම්. කපුවත්ත මිය | සංවර්ධන නිලධාරී |
| 04. | එම්.ඩී.එස්.එස්. වීරසිංහ මිය | සංවර්ධන නිලධාරී |
| 05. | ඒ.කේ.එස්. බෝදිකා නන්දනී මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 06. | ඩී.ජී. එදිරිසූරිය මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 07. | එම්. ඩබ්ලිව්. ලක්ෂ්මන් කුමාර මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර |

| | නම | තනතුර |
|---|---|---|
| 08. | එම්.ඩබ්ලිව්.ඒ.එස්. ශාන්තමාලි මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 09. | ඩබ්ලිව්.පී. කල්‍යාණි ගුණරත්න මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 10. | එච්.ඩී.එල්.එම්. ශ්‍රියන්ති මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 11. | කේ.ජී. ද සිල්වා මයා | රියදුරු |
| 12. | එච්.ඩී.පී. සරත් කුමාර මයා | රියදුරු |
| 13. | එච්.ආර්.එන්.එස්. නන්දසේන මයා | කා.සේ.සේ. |
| 14. | ආර්.එන්.ඩබ්ලිව්. මුදලිගේ මයා | කා.සේ.සේ. |

**2013 වර්ෂයේ දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරුවී ගිය නිලධාරීන්**

| | නම | තනතුර |
|---|---|---|
| 01. | එච්.සී.ඩී.එල්. සිල්වා මයා | අධ්‍යක්ෂ |
| 02. | ඩබ්ලිව්.කේ.පී.එච්.එන්. රුද්‍රිගු මිය | පර්යේෂණ සහකාර |
| 03. | අනුරුද්ධිකා වීරරත්න මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 04. | එච්.ඒ. රාජකරුණා මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 05. | ඩී.ජී. එදිරිසූරිය මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර (කාලය 2013.01.02 සිට 2013.06.28) |
| 06. | එම්. ඩබ්ලිව්. ලක්ෂ්මන් කුමාර මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර (කාලය 2013.01.08 සිට 2013.01.10) |
| 07. | එච්.ඩී.එල්.එම්. ශ්‍රියන්ති මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර (කාලය 2013.09.17 සිට 2013.12.31) |
| 08. | එස්.ඒ.එස්. සුරංජ මයා | කා.සේ.සේ. |
| 09. | ඩී.කේ. ජයරත්න මයා | රියදුරු |

## 4.2 කාර්ය මණ්ඩල පුහුණුවීම්

දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධනය උදෙසා කාර්ය මණ්ඩලයේ වෘත්තීය කුසලතා ඔප් නැංවීමේ අරමුණින් 2013 වර්ෂය තුලදී ද දේශීය හා විදේශීය පුහුණු පාඨමාලා සඳහා නිලධාරීන් සහභාගී කරවන ලදී.

### 4.2.1 2013 වර්ෂයේ දේශීය පුහුණුවීම්

පහත දැක්වෙන පරිදී දේශීය පුහුණුවීම් සඳහා 2013 වර්ෂය තුල දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගීවී ඇත.

| නිලධාරියාගේ නම | තනතුර | පුහුණු වැඩසටහන හා පුහුණු ආයතනය | පුහුණු කාලය |
|---|---|---|---|
| කේ.ආර්.ආර්. ප්‍රනාන්දු මිය<br>ජී.ඩී.කේ. ලියනගේ මිය | රා.ක.ස. | සිගාස් වැඩසටහන බෙදාහැරීම හා උපදෙස් පිළිබඳ වැඩමුළුව<br>රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව | 2013.01.10 |
| ආර්.ආර්.කේ. නුගපිටිය මයා<br>එම්.ඒ.කේ.පී. විජේවන්ත මිය<br>එස්.එම්. දයාරත්න මයා<br>එස්.කේ. කුසලකුමාරන් මයා<br>ඒ.කේ. ගුණසේකර මෙය<br>වී.අයි. දිල්හානි මෙය | අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ<br>නි. අධ්‍යක්ෂ<br>ස. අධ්‍යක්ෂ | Sri Lanka Public Sector Accounting Standards<br>රාජ්‍ය මූල්‍ය ගණකාධිකරණ ආයතනය (APFA) | 2013.01.30 |
| දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන් | | කාර්යාභිවර්ධන පුහුණුව - 2013<br>කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව | 2013.02.15<br>2013.03.05 |
| එස්.ඒ. චන්ද්‍රිකා කුලතිලක මිය<br>වී.අයි. දිල්හානි මෙය | අ. ජනරාල්<br>ස. අධ්‍යක්ෂ | Capacity Building Training Programme (ITMIS Project)<br>මිලෝදා ආයතනය | 2013.02.28<br>2013.03.01 |
| ජී.ඩී.කේ. ලියනගේ මිය | රා.ක.ස. | උසස් පරිගණක පුහුණුව<br>රාජ්‍ය සේවා පුහුණු ආයතනය | 2013.03.25<br>2013.03.28 |
| එස්.එම්. දයාරත්න මයා | අධ්‍යක්ෂ | Microsoft Office – 2010<br>The Institute of Chartered Accountants of Sri Lanka | 2013.03.27<br>2013.03.28 |
| ආර්.ආර්.කේ. නුගපිටිය මයා<br>එම්.ඒ.කේ.පී. විජේවන්ත මිය<br>එස්.එම්. දයාරත්න මයා<br>වී.අයි. දිල්හානි මෙය | අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ<br>ස. අධ්‍යක්ෂ | How to Minimize Audit Queries and Improve Public Accountability<br>රාජ්‍ය මූල්‍ය ගණකාධිකරණ ආයතනය (APFA) | 2013.04.05 |
| | | | |

| නිලධාරියාගේ නම | තනතුර | පුහුණු වැඩසටහන හා පුහුණු ආයතනය | පුහුණු කාලය |
|---|---|---|---|
| ආර්.ආර්.කේ. නුගපිටිය මයා<br>එම්.ඒ.කේ.පී. විජේවන්ත මිය<br>එස්.එම්. දයාරත්න මයා<br>එස්.කේ. කුසලකුමාරන් මයා<br>ඒ.එන්. හපුගල මයා<br>වී.අයි. දිල්හානි මෙය | අධ්‍යක්‍ෂ<br>අධ්‍යක්‍ෂ<br>අධ්‍යක්‍ෂ<br>අධ්‍යක්‍ෂ<br>අධ්‍යක්‍ෂ<br>ස. අධ්‍යක්‍ෂ | Sri Lanka Public Sector Accounting Standards<br>රාජ්‍ය මූල්‍ය ගණකාධිකරණ ආයතනය (APFA) | 2013.06.10<br>2013.06.11 |
| එම්.ඩබ්ලිව්.ඒ.එස්. ශාන්තමාලි මිය | රා.ක.ස. | රජයේ විගණන කටයුතු<br>ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2013.06.13<br>2013.06.14 |
| කේ.ඒ.බී.එම්. ගුණරත්න මෙය | රා.ක.ස. | කාර්යාල කළමනාකරණ හා කාර්යාල ක්‍රමවේද<br>නිපුණතා සංවර්ධන අරමුදල (SDFL) | 2013.06.25<br>2013.06.26 |
| ජී.ඩී.කේ. ලියනගේ මිය<br>එච්.කේ.සී. ප්‍රියදර්ශනී මිය<br>එම්.ඩබ්ලිව්.ඒ.එස්. ශාන්තමාලි මිය<br>ඒ. වීරරත්න මිය<br>ඊ.එම්.ජී.එල්. ඒකනායක මිය<br>කේ.ඒ.බී.එම්. ගුණරත්න මෙය<br>කේ.ඒ.එච්.එම්. කපුවත්ත මිය | රා.ක.ස.<br>රා.ක.ස.<br>රා.ක.ස.<br><br>රා.ක.ස.<br>රා.ක.ස.<br>රා.ක.ස.<br>සංවර්ධන නිලධාරී | දෙමළ භාෂාව - දෙවන මට්ටම<br>මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය | 2013.07.23 |
| කේ.ආර්.ආර්. ප්‍රනාන්දු මිය | රා.ක.ස. | Payroll System<br>රාජ්‍ය මූල්‍ය ගණකාධිකරණ ආයතනය (APFA) | 2013.09.03<br>2013.09.07 |
| එස්.එම්. දයාරත්න මයා | අධ්‍යක්‍ෂ | Conference 2013 Authentic Report<br>ශ්‍රී ලංකා ගණකාධිකාරී ශිල්පීය ආයතනය | 2013.09.09<br>2013.09.10 |
| එච්.ආර්.එන්.එස්. නන්දසේන මයා | කා.සේ.සේ. | කාර්යාල සේවක සේවයේ කාර්යාභිවර්ධනය<br>ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2013.11.04<br>2013.11.06 |
| ඊ.එම්.ජී.එල්. ඒකනායක මිය | රා.ක.ස. | තෙදින සේවාරම්භක පුහුණු වැඩමුළුව<br>නිපුණතා සංවර්ධන අරමුදල | 2013.11.25<br>2013.11.27 |
| දෙපාර්තමේන්තුවේ නිලධාරීන් | | කාර්යාභිවර්ධන පුහුණු (නේවාසික) වැඩමුළුව<br>ත්‍රිකුණාමලය සර්වෝදය පුහුණු මධ්‍යස්ථානය | 2013.12.21<br>2013.12.23 |

## 4.2.2 විදේශීය පුහුණු

නිලධාරීන් පහත සඳහන් පරිදි 2013 වර්ෂයේදී විදේශීය පුහුණු වැඩසටහන් හා දූත මණ්ඩලවලට සහභාගී වී ඇත.

| නිලධාරියාගේ නම | තනතුර | පුහුණු පාඨමාලාව / වැඩමුළුව | පැවැත්වූ රට | කාලය |
|---|---|---|---|---|
| ඒ.කේ. ගුණසේකර මෙය | නියෝජ්‍ය අධ්‍යක්ෂ | IMF Macroeconomic Seminar for Asia (JIMS) | ජපානය | 2013.02.25 2013.03.01 |
| වී.අයි. දිල්හානි මෙය | සහකාර අධ්‍යක්ෂ | e-Governance and Change Management | සිංගප්පූරුව | 2013.07.15 2013.07.19 |
| එස්.ඒ. චන්ද්‍රිකා කුලතිලක මිය | අධ්‍යක්ෂ ජනරාල් | e-Governance and Change Management | සිංගප්පූරුව | 2013.10.04 2013.10.08 |
| ඩී.යූ.එස්. වික්‍රමආරච්චි මයා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | e-Governance and Change Management | සිංගප්පූරුව | 2013.10.25 2013.10.29 |
| එස්.ඒ. චන්ද්‍රිකා කුලතිලක මිය | අධ්‍යක්ෂ ජනරාල් | 30th Anniversary Session of Intergovernmental Working Group of Experts on International Standards of Accounting and Reporting | ජිනීවා - ස්විස්ටර්ලන්තය | 2013.11.06 2013.11.08 |
| ඩී.යූ.එස්. වික්‍රමආරච්චි මයා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | Seminar of Island Economy for Development Countries | චීනය | 2013.11.06 2013.11.26 |
| ඒ.එන්. හපුගල මයා | අධ්‍යක්ෂ | 30th Anniversary Session of Intergovernmental Working Group of Experts on International Standards of Accounting and Reporting | ජිනීවා - ස්විස්ටර්ලන්තය | 2013.11.06 2013.11.08 |

### 4.2.3 කාර්යාභිවර්ධන වැඩසටහන්

දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්ය මණ්ඩලයේ කාර්යාභිවර්ධනය උදෙසා 2013 වර්ෂය තුලදී පහත දැක්වෙන වැඩසටහන් සංවිධානය කරන ලදී.

- දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී ඇති චක්‍රලේඛ පිළිබඳ අවබෝධයක් ලබාදීමේ අරමුණ ඇතිව කාර්යාභිවර්ධන පුහුණු වැඩසටහන් මාලාවක් 2013.02.15 සිට 2013.03.05 දක්වා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී. දෙපාර්තමේන්තුව විසින් මේ දක්වා නිකුත් කරන ලද චක්‍රලේඛ හත (07) ආවරණය කරමින් දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් විසින් දේශණ පවත්වන ලදී.

- කළමනාකරන විගණන දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරීන්ගේ දැනුම සහ හැකියාවන් වර්ධනය කිරීම හා ධනාත්මක සිතුවිලි වර්ධනය කිරීම තුලින් උපරිම කාර්යක්ෂම හා ඵලදායී සේවයක් ලබා ගැනීමටත්, නිලධාරීන් අතර අන්‍යොන්‍ය සුහදතාවය වර්ධනය කිරීමත් අරමුණු කරගනිමින් සංවිධානය කරන ලද නේවාසික කාර්යාභිවර්ධන පුහුණු වැඩසටහන 2013 වර්ෂයේ දෙසැම්බර් මස 21, 22 සහ 23 යන දිනයන්හිදී ත්‍රිකුණාමලය සර්වෝදය පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්වීමට යෙදුණි.